බන්ධ:කො:ජ: චක්‍ර ලේඛ අංක: 27/2016

මගේ අංකය: කේ.03/51/ 225 /16,
බන්ධනාගාර මුලස්ථානය,
කොළඹ 09,
2016.10.28 දින.

සියලුම බන්ධනාගාර අධිකාරින් හා
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත.

**2017 වසරට ආගමික වතාවත් සිදුකිරිම සඳහා පුජකවරුන් පත් කිරිම**

දිවයිනේ සියලුම බන්ධනාගාර ආයතන වල රදවා ඇති සිර / සැකකරුවන් සඳහා 2016 වර්ෂයේ ආගමික කටයුතු සිදුකිරිම සඳහා ලබාදී ඇති නිල කාලසීමාව 2016.12.31 වෙනි දිනෙන් අවසන් වන බැවින් , 2017 වර්ෂයේ එම කටයුතු සිදුකිරිම සඳහා අළුතින් පුජකවරුන් පත්කිරිමට නියමිතව ඇත.

02. එබැවින් , ඔබ ආයතනයේ හා අනුබද්ධ බන්ධනාගාර ආයතනවල රදවා සිටින කාන්තා හා පිරිමි නේවාසිකයින් හට ආගමික වතාවත් සිදුකිරිම සඳහා පහත ආකෘති පත්‍රයට අනුකුලව නිවැරදි තොරතුරු ඇතුලත්ව සැකසු පුජකවරුන්ගේ නාම ලේඛණයක් 2016.12.10 වෙනි දිනට පෙර මා වෙත එවිය යුතුය.

03. ඉහත පුජකවරුන් පත්කිරිමට පෙර දැනට පත්කර ඇති පුජකවරුන් විසින් අදාල වර්ෂය තුල ආයතනයේ පිරිමි හා කාන්තා සිර /සැකකරුවන් හට ආගමික වතාවත් සිදුකිරිම සඳහා කොපමණ වාරයක් ආයතනයට පැමිණ නියමිත ආගමික කටයුතු සිදුකලාද , නැද්ද යන්න හා ඔවුන් විසින් නේවාසිකයින් වෙනත් ආගම් වලට හැරවිමට උත්සාහ දරා තිබේද , බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා පරිපාලනය විවේචනය වන අන්දමට ක්‍රියාකර ඇත්ද යන කරුණු සම්බන්ධයෙන් ඔබ විසින් පුර්ණ ඇගයිමක් සිදුකොට සුදුසු පුජකවරුන්ගේ නාම ලේඛණය සකස්කල යුතුය .

04. මිට අමතරව , ඉහත තොරා ගැනිම් සිදුකිරිමේදි පසුගිය කාලවකවානුවේ ආගමික වතාවත් සිදුකරන ලද පුජකවරුන්ගෙන් නේවාසිකයින් හට පලදායි ලෙස ආගමික මෙහෙවරක් ඉටුඋවාද එසේ නිසියාකාරව ආගමික වතාවත් ඉටුනොකරන ලද පුජකවරුන් හා එම කණ්ඩායම් වල නම් ඉවත්කර අළුතින් සුදුසු නම් අදාල නාමලේඛණයට ඇතුලත් කල යුතුය . එසේ නම් ඉවත් කරනු ලබන පුජකවරුන් සිටින ආයතන වල අධිකාරි විසින් අදාල පුජකවරයා ඉවත් කිරිමට ඊට හේතු කරුණු ඇතුලත් වන පරිදි සංසිප්ත වාර්තාවක් එවිය යුතුය.

05. දැනට එල්.ටී.ටී.ඊ නේවාසිකයින් රදවා සිටින ආයතන වලට පුජකවරුන් පත්කිරිමේදි එම පුජකවරුන් පදිංචි ප්‍රදේශවලට අයත් පොලිසිය මගින් පොලිස් වාර්තාවක් ලබාගෙන ඒ අනුව අදාල නම් ඇතුලත් කිරිම වඩාත් සුදුසු වන බව දන්ව අතර , 2016 වර්ෂයේ පත්කරන ලද පුජකවරුන්ගෙන් එක් එක් ආගම් වලට අදාලව පත්කරන ලද ප්‍රධාන පුජකතුමා සමග සාකච්ඡා කර ආයතනයේ සිටින සිර / සැකකරුවන් සංඛ්‍යාවට සරිලන පරිදි තෝරාගනු ලබන පුජකවරුන්ගේ නම් පමණක් නියමිත දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව එවිමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

**2017 වර්ෂය සඳහා පුජකවරුන් පත් කිරිම**

.................................. බන්ධනාගාරය

| බෞද්ධ | නේවාසික සංඛ්‍යාව | කතෝලික | නේවාසික සංඛ්‍යාව | ඉස්ලාම් | නේවාසික සංඛ්‍යාව | මෙතෝදිස්ත | නේවාසික සංඛ්‍යාව | හින්දු | නේවාසික සංඛ්‍යාව | වෙනත් | නේවාසික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

එච්.එම්.එන්.සී.ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ - 09.